# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1992/73 - 2016 නොවැම්බර් මස 11 වැනි සිකුරාදා - 2016.11.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ, බුළුවේමුදුන සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 නොවැම්බර් මස 03 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1250.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 709, ලුණුකැටියාමඩිත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ලුණුකැටියාමඩිත්ත ගමේ පිහිටි, බලය ලත් මිනින්දෝරු ටී. පියසේන මහතා විසින් මැන සකස් කරන ලද, අංක 1653 දරන බලය ලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 4 න් හා 5 න් කොටසක් ලෙස දැක්වෙන, ''ලුණුකැටියාමඩිත්ත හේන'' නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් පර්චස් 06 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

ඉඩමේ නම : ලුණුකැටියාමඩිත්ත හේන
ප්‍රමාණය : පර්චස් 06

මායිම් :

*උතුරට* : බුළුවේමුදුන සිට ලුණුකැටියාමඩිත්ත දක්වා දිවෙන මාර්ගය ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : රජයේ ඉඩම ;
*බටහිරට* : බුළුවේමුදුන සිට ලුණුකැටියාමඩිත්ත දක්වා දිවෙන මාර්ගය.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :*

1. මාලනී ආරියරත්න මහත්මිය,
   අංක 13, පන්සල පාර,
   ලියන්ගස් වගුර,
   පන්විල.

2. නිල්මිණි මල්රුක්ෂි ආරියරත්න මහත්මිය,
   අංක 15, පන්සල පාර,
   ලියන්ගස් වගුර,
   පන්විල.

11 - 1270